" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204. டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.
ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொது இலக்கம் / General Telephone — 011 - 2093000
SLSI ISO 9001 — SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-BK/05/FI/01-2020 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. දිනය / திகதி / Date 2020.02.03

බස්නාහිර පළාත් සභාවේ සියලුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානින් ,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

<u>පළාත් සභාවේ ගිණුම් පවත්වා ගෙන යාම සහ එහි පොත් සමඟ පළාත් සභා අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ කාර්යාල වල පොත් සැසඳීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ අංක CSO/FIN/6/2/6 හා 2017.06.01 දිනැති ලිපිය හා බැඳේ.

02. පළාත් මූල්‍ය රීති 307 ප්‍රකාරව පළාත් භාණ්ඩාගාරයෙන් අග්‍රිම නිදහස් කරනු ලබන සෑම පළාත් සභා අමාත්‍යාංශයක්ම/ දෙපාර්තමේන්තුවක්ම/ කාර්යාලයක්ම සිය ගිණුම් පොත්, මාසිකව පළාත් භාණ්ඩාගාරයේ පොත් සමඟ සැසඳිය යුතු ව ඇත. එසේ සැසඳීම සඳහා මාසික වාර්තාවක් පළාත් භාණ්ඩාගාරය විසින් සියළු කාර්යාල සඳහා අන්තර්ජාලය (www.wpc.gov.lk) මගින් උඩුගත (upload) කරන අතර, එම වාර්තාව අනුව දෙපාර්තමේන්තු පොත් සැසඳේ ද යන්න පරික්ෂා කර ඒ පිළිබඳ වාර්තාවක් පළාත් භාණ්ඩාගාරය වෙත එවිය යුතුව ඇත. නමුත් එම වාර්තාව මාසිකව නිසි පරිදි පළාත් භාණ්ඩාගාරය වෙත නොඑවන බවටත්, වර්ෂය අවසාන වන විට පළාත් භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් එකිනෙකට නො සැසඳෙන අවස්ථා පවතින බවටත් නිරීක්ෂණය වී ඇත.

03. එසේ මාසික පොත් නොසැසඳීමෙන් වර්ෂය අවසන් වන තෙක් ගිණුම්කරණමය අඩුපාඩු නිරවුල් නොවීම හේතුවෙන් අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමට ද ප්‍රමාද වන බව පෙනී යයි.

04. එබැවින්, පළාත් භාණ්ඩාගාරයේ මාසික සැසඳුම් වාර්තාව නිකුත් කළ විගස, තම දෙපාර්තමේන්තු පොත් සමඟ සසඳා බලා මේ සමඟ අමුණා ඇති CSWP/FIN-BK/FO/03 ආකෘති පත්‍රය ප්‍රකාරව සකස් කරන ලද වාර්තාවේ පරිලෝකන පිටපතක් (Scan copy) bookkeepingcigas@gmail.com යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

05. විද්‍යුත් තැපැල් පණිවුඩය (e-mail ) යොමු කිරීමේ දී විෂය කරුණ (Subject) ලෙස කාර්යාලයේ නම ද සකස් කරන ලද මාසය හා කාර්යාල අංකය ද (Bank code ) පහත පරිදි සටහන් කර එවන ලෙස වැඩි දුරටත් දන්වමි.

නිද- **Irrigation Dept,WP /January 2020 : 020**

එන්.බන්දුල ප්‍රේමකුමාර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය )
ප්‍රධාන ලේකම්, පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.